Article 12(1).

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019-02-08 |

පැමිණිලිකරු : වී.එම්.ආර්. දිනේෂ් වෙන්ඩකෝන් මහතා,
230/ඒ/2, සඳගිරිය වත්ත,
අස්ගිරිය, ගම්පහ.

වගඋත්තරකරුවන් :

01. එච්. එම්. පී. වත්සලා මිය.
විදුහල්පති,
ගම්පහ යශෝධරා දේවි බාලිකා විද්‍යාලය,
ගම්පහ.

02. ඩබ්ලිව්. මල්ලිකා මිය.
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
ගම්පහ.

03. එම්. පී. රත්නසේන මහතා.
අභියාචනා කමිටුවේ සභාපති,
සුනේත්‍රා දේවි විද්‍යාලය,
ඉඹුල්ගොඩ.

**පැමිණිලි අංකය : HRC/237/17**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් 2017-01-27 වන දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් දක්වා ඇත්තේ, තම දරුවන් දෙදෙනා වන වී.එම්.ඩී. අමාෂා වෙන්ඩකෝන් සහ වී.එම්.ඩී. අමායා වෙන්ඩකෝන් යන තම නිවුන් දරුවන් දෙදෙනා 2017 වසරේ ගම්පහ යශෝධරා දේවි බාලිකා විද්‍යාලයට ඇතුළත් කිරීමේ අරමුණින් ආසන්නතා පදනම යටතේ, අධ්‍යයන කාර්ය මණ්ඩල ගණය යටතේ සහ රාජ්‍ය සේවයේ ස්ථාන මාරුවීම් යටතේ අයදුම්පත් යොමු කළ බවත්, නමුත් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවේ ආසන්න පදිංචිය යටතේ පමණක් වන බවත් ඒ අනුව කැඳවීම් අංක එච් 141 සහ එච් 143 යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී පැමිණිලිකරු විසින් ලකුණු 95ක් උපයා ගන්නා ලද බවත්ය. නමුත් තමාට වඩා අඩු ලකුණු ලබා



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන
ලේකම් 011-2505521
ක්ෂණික 011-2505575
වෙබ් www.hrcsl.lk

ගත් සිසුන් කිහිපදෙනෙකු පාසලට ඇතුළත් කර ගැනීමට වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බවත්, පාසලට ඇතුළත් කිරීමේ අවම ලකුණු 95 සීමාව වන බවත් පැමිණිලිකරු කොමිෂන් සභාව හමුවේ දන්වා ඇත.

තවද, ආසන්නතා පදනම යටතේ තමා ලකුණු 95ක් උපයාගෙන ඇති අතර, තමාට විරෝධතාවයක් නොමැතිව තිබියදී අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් පැමිණිලිකරුව දැනුවත් නොකර ලකුණු 05ක් අඩු කර ඇති බවත්, චක්‍ර ලේඛනයට පටහැනිව සභාපතිවරයා කටයුතු කර ඇති බවත්, මේ අනුව සියලු සුදුසුකම් සපුරා ඇති හා අවශ්‍ය ලකුණු උපයාගෙන ඇති තම දරුවන් දෙදෙනා පාසලට නොගැනීම හේතුවෙන් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරමින් දක්වා ඇත.

**01 වන වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරු කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකරු ආසන්නතාවය පදනම මත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ලකුණු 95 බැගින් උපයාගෙන ඇති නමුත් අභියාචනා මණ්ඩලයේ සභාපතිවරයා විසින් ලකුණු 05ක් අඩු කිරීම හේතුවෙන් මෙම පැමිණිලිකරුගේ දරුවන් දෙදෙනා පාසලට ඇතුළත් කර ගැනීමට නොහැකි වූ බවයි.

**02 වගඋත්තරකරු වන අභියාචන මණ්ඩලයේ සභාපතිවරයාගේ ප්‍රකාශය :-**

අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකරුට ලකුණු 95ක් අදාළ විදුහල්පතිනිය විසින් ලබා දී තිබූ බවත්, නමුත් ගම්පහ ප්‍රදේශයට අයත් අස්ගිරිය, බටහිර ප්‍රදේශයේ පවතින පාසලක් වෙනුවෙන් ලකුණු 05ක් අඩු විය යුතු බැවින්, එම ලකුණු 05 මුළු ලකුණු මට්ටමින් අඩු කළ බවත්ය.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු ආසන්නතා පදනම මත කැඳවීම් අංක එච් 141 හා එච් 143 යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ලකුණු 95ක් උපයාගෙන ඇති අතර, ආසන්නතා පදනම යටතේ පාසල ළමුන් ඇතුළත් කිරීමේ අවම ලකුණු සීමාවද ලකුණු 95 වේ.

ඉදිරිපත් වී ඇති කරුණු අනුව ආසන්නතා පදනම යටතේ පැමිණිලිකරුට වඩා අඩු ලකුණු ලබා ඇති දරුවන් මේ වන විට පාසලට ඇතුළත් කර ගෙන ඇති බවත්, මානව හිමිකම් කොමිෂන් සභා හමුවේ අනාවරණය වී ඇත.

පැමිණිලිකරුගේ දරුවන් දෙදෙනා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 95 බැගින් උපයාගෙන ඇති අතර, අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් පැමිණිලිකරුට විරෝධතා නොතිබියදීත්

පැමිණිලිකරුගේ ලකුණු 05 අඩු කර ඇති බවටත් පැමිණිලිකරු අභියාචනා මණ්ඩලයට කැඳවා නොමැති අතර, ඔහුට දැනුවත් නොකර අභියාචනා මණ්ඩලයේ සභාපතිගේ අභිමතය පරිදි චක්‍රලේඛයට පටහැනිව කටයුතු කර ඇති බවටත් කරුණු පැහැදිලි වේ.

චක්‍රලේඛන ප්‍රකාරව ගුවන් දුර සලකා බැලීමට උපදෙස් දී තිබියදී එසේ සලකා බැලීමක් සිදු කර නොමැති බවත්, සිතියම් නොමැති නිසා චක්‍රලේඛනය අනුගමනයක් සිදු කිරීම එයට හේතු වූ බවත් වගඋත්තරකරුවන් දන්වා ඇත.

අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් පැමිණිලිකරු විසින් උපයාගත් ලකුණු 95න් ලකුණු 05ක් ඉවත් කර ඇති අතර, අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් ගුවන් දුරට අදාළ සිතියම පරීක්ෂා කර බලා නොමැති බවත්, පැමිණිකරුට විරෝධතාද තිබී නොමැති බවත්, ඒ අනුව තුන්වන වගඋත්තර පාර්ශවීය අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් අත්තනෝමතිකව පැමිණිලිකරුට හිමිවිය යුතු ලකුණු 05 අහිමි කර ඇති බවත් නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර විදුහල්පතිනිය ලකුණු 95ක් ලබා දී තිබියදී අභියාචනා මණ්ඩලයේ සභාපති හට ඔහුගේ අභිමතය පරිදි ලකුණු වෙනස් කිරීමට හැකියාවක් නොමැත. එසේ ලකුණු වෙනස් කිරීමක් සිදු කලේ නම් අදාළ පැමිණිලිකරු ගෙන්වා ඔහු ඉදිරියේ ඔහුගේ ලකුණු වෙනස් කළ යුතු බවට දැන්විය යුතුවේ. මෙලෙස ලකුණු ඉවත් කිරීම නිසා පැමිණිලිකරුට ඉතා බරපතල ලෙස ඔහුගේ අයිතිවාසිකම් අභියාචනා මණ්ඩලයේ සභාපති විසින් උල්ලංඝනය කර ඇති බව කොමිෂන් සභාව හමුවේ නිරික්ෂණය වී ඇත.

පැමිණිලිකරු ආසන්නතා පදනම යටතේ එච් 141 සහ එච් 143 යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ලකුණු 95ක් බැගින් උපයාගෙන ඇති අතර, ආසන්නතා පදනම යටතේ පාසලට ඇතුලත් කර ගැනීමේ අවම ලකුණු සීමාව ලකුණු 95 කි. ඒ අනුව මෙම පැමිණිලිකරුගේ දරුවන් දෙදෙනාට පාසලට ඇතුලත් වී අධ්‍යාපන ලැබීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

**නිගමනය :-**

ඉහත කරුණු අනුව 2017 වසරේ ගම්පහ යශෝධරා දේවි බාලිකා විද්‍යාලයට දරුවන් ඇතුලත් කර ගැනීමේ පවතින චක්‍ර ලේඛයට පරිබාහිරව සාධාරණීය කළ නොහැකි ආකාරයට කටයුතු සිදු කර ඇති බවත්, 03 වන වගඋත්තරකරු වන ඉඹුල්ගොඩ, සුනේත්‍රා දේවි විද්‍යාලයේ විදුහල්පති. (අභියාචනා කමිටුවේ සභාපති) එම්. ජී. රත්නසේන මහතාගේ එකී අත්තනෝමතික ක්‍රියාපටිපාටිය හේතුවෙන් අදාළ සුදුසුකම් ලබා ඇති පැමිණිලිකරුගේ දරුවන් දෙදෙනාට පාසලට ඇතුලත් වීමේ අවස්ථාව අහිමි වී ඇති බවත් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරයි.

තිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකරු හට ලකුණු ලබා දීමේදී පදිංචි ස්ථානය තීරණය කිරීම නිසි ප්‍රමවේදයක් භාවිතා කිරීමෙන් තොරව සිදුව ඇති බැවින් නැවත සිතියම් ආශ්‍රයෙන් පැමිණිලිකරුගේ පදිංචිය පරීක්ෂා කර බලා ඒ අනුව පැමිණිලිකරුගෙන් ඉවත් කරන ලද ලකුණු 5 ක ප්‍රමාණය සඳහා පැමිණිලිකරු හිමිකම් ලබන්නේ නම් පැමිණිලිකරුගේ දරුවන් දෙදෙනා වන වී.එම්.ඩී. අමාෂා සහ වී.එම්.ඩී. අමායා යන දරුවන් වගඋත්තරකාර විද්‍යාලයේ 2019 වර්ෂයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුලත් කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

මෙම නිර්දේශය අනුව කටයුතු කර 2019.02.28 වන දිනට පෙර වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :- 01 ගරු අමාත්‍යතුමා.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

02 ලේකම්.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

B/R7